ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය

කළමනාකරණ අධ්‍යයන පීඨය

මානව සම්පත් කළමනාකරණය පිළිබඳ උසස් සහතිකපත්‍ර පාඨමාලාව

**HRC2404** - මානව සම්පත් කළමනාකරණය සඳහා තීරණ ගැනීමේ මෙවලම්

අවසාන විභාගය - **2024**

කාලසීමාව - පැය තුනකි **(03)**

0128

---

දිනය: 19.10.2024 කාලය: ප.ව 01.30 සිට ප.ව. 04.30

---

උපදෙස්:

- මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න හතකින් (07) සමන්විත වේ. සියලුම ප්‍රශ්න වලට සමාන ලකුණු ඇත. ප්‍රශ්න හතෙන් (07) ඕනෑම ප්‍රශ්න හතරකට (04) පිළිතුරු සපයන්න.
- ලබා දී ඇති පිළිතුරු පොතෙහි **(Answer Booklet)** ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- කියවිය නොහැකි අත් අකුරු සඳහා ලකුණු අඩු විය හැක.

---

<u>ප්‍රශ්න අංක **01**</u>

ඔබ 1,000 සේවකයින්ගෙන් සමන්විත සංස්ථාවක සේවකයින්ගේ සාමාන්‍ය වාර්ෂික වැටුප (average annual salary) තීරණය කිරීම සඳහා සමීක්ෂණයක් (survey) පවත්වන බව සිතන්න. ඉහත තත්ත්වය සඳහා ලබාගත් සේවකයින් 50 දෙනෙකුගේ නියැදියක් (sample) සඳහා වාර්ෂික වැටුප් අගයන් (දහස් ගණනින්) පහත දැක්වේ

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 26 | 64 | 34 | 72 | 34 | 24 | 41 | 27 | 77 | 27 |
| 40 | 52 | 73 | 25 | 63 | 53 | 75 | 46 | 56 | 33 |
| 63 | 73 | 80 | 79 | 34 | 34 | 30 | 75 | 67 | 54 |
| 55 | 80 | 41 | 28 | 74 | 33 | 33 | 49 | 41 | 31 |
| 71 | 40 | 50 | 52 | 31 | 22 | 65 | 26 | 44 | 67 |

a) ඉහත දත්ත උපයෝගී කරගෙන පහත සඳහන් දේ ගොඩනගන්න

i. සංඛ්‍යාත ව්‍යාප්ති වගුව (Frequency Distribution Table)
(සමාන ප්‍රමාණයේ පන්ති අන්තරයන් 0 සිට 10 දක්වා, 10 සිට 20 දක්වා ආදී ලෙස සලකන්න.)
(ලකුණු 6)

ii. ජාල රේඛය (Histogram) (ලකුණු 5)

iii. සංඛ්‍යාත බහු අස්‍රය (Frequency Polygon) (ලකුණු 2)

b) a කොටසේ (i) ප්‍රශ්නයේ ඔබ ලබාගත් සංඛ්‍යාත ව්‍යාප්ති වගුව (Frequency Distribution Table) ඇසුරින් පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න

i. මධ්‍යන්‍ය (Mean) (ලකුණු 3)

ii මධ්‍යස්ථය (Median) (ලකුණු 4)

iii. මාතය (Mode) (ලකුණු 3)

iv. පරාසය (Range) (ලකුණු 2)

**(මුළු ලකුණු 25)**

<u>ප්‍රශ්න අංක 02</u>

a) සේවකයන් තිදෙනෙකුගේ කාර්යසාධනය (Performance) මත, ඒ සඳහා ප්‍රසාද දීමනා (bonus) ලබා දීම සඳහා සමාගමක මානව සම්පත් කළමණාකරුවෙකු සතුව රුපියල් 8000 ක අයවැයක් (budget) පවතියි. මෙහිදී දෙවන සේවකයාට පළමු සේවකයාට වඩා දෙගුණයක් ලැබෙන පරිදි ප්‍රසාද දීමනා වෙන් කළ යුතු අතර තුන්වන සේවකයාට දෙවැන්නාට වඩා රුපියල් 500ක් අඩු වේ. එක් එක් සේවකයාට ලැබෙන ප්‍රසාද දීමනා ප්‍රමාණය ගණනය කරන්න

**(ලකුණු 10)**

b) සමාගමක් තම සේවකයින් සඳහා පවත්වන පුහුණු සැසි සහ වැඩමුළුවල පිරිවැය ගණනය කිරීමට සැලසුම් කරයි. පුහුණු සැසි 3ක් සහ වැඩමුළු 4 ක් පැවැත්වීම සඳහා රු. 25,700.00 ක් වන අතර පුහුණු සැසි 4 ක් සහ වැඩමුළු 3 ක් පැවත්වීම සඳහා රු. 32,400.00 ක් වැයවන බව ඔවුන් සොයාගෙන ඇත. එක් පුහුණු සැසියක පිරිවැය සහ වැඩමුළු 10 ක් සඳහා යන පිරිවැය ගණනය කරන්න.

**(ලකුණු 15)**

**(මුළු ලකුණු 25)**

<u>ප්‍රශ්න අංක 03</u>

a) සමාගමකට මාසයක් තුළ මිලදී ගත් අමුද්‍රව්‍යවල ගුණාත්මකභාවය පරීක්ෂා කිරීමට අවශ්‍ය වන අතර එක් එක් කාණ්ඩයේ ද්‍රව්‍යවලින් 25% ක් පරීක්ෂා කිරීමට තීරණය කර ඇත. සමාගම දැනට ද්‍රව්‍ය 3ක් (A, B, C) භාවිතා කරන අතර, තොග පිළිවෙලින් A, B සහ C වලින් ඒකක 400ක්, ඒකක 320ක් සහ ඒකක 480ක් පවතී.

i. ජනගහන ප්‍රමාණය (population size) සහ නියැදි ප්‍රමාණය (sample size) කොපමණද? **(ලකුණු 4)**

ii. ඔබට සරල සසම්භාව්‍ය අමුද්‍රව්‍ය නියැදියක් (simple random sample of raw material) තෝරා ගත හැකි ආකාරය පැහැදිලි කරන්න. **(ලකුණු 6)**

iii. ඔබට අමුද්‍රව්‍යවල ස්තෘත නියැදියක් (stratified sample of raw material) තෝරා ගත හැකි ආකාරය පැහැදිලි කරන්න. **(ලකුණු 9)**

b) පහත සඳහන් විචල්‍ය ප්‍රමාණාත්මක / ගුණාත්මක (numerical/ categorical) ලෙස වර්ගීකරණය කර ඒවායේ මිනුම් පරිමාණයන් (scales of measurements) හඳුනා ගන්න.

**(ලකුණු 6)**

i. හිසකෙස් වර්ණය

ii විභාගයට ලැබුණු ශ්‍රේණිය

iii. මාසික ආදායම රුපියල් වලින්

**(මුළු ලකුණු 25)**

## <u>ප්‍රශ්න අංක 04</u>

a). ව්‍යාපාරයක සමස්ත වටිනාකම (Overall value) සඳහා අස්පෘශ්‍ය වත්කම් (intangible assets) වැදගත් වන්නේ ඇයි? (ලකුණු 10)

b). ව්‍යාපාරයක ධනය (business's wealth) කළමනාකරණය කිරීම සඳහා උපාය මාර්ග (strategies) කිහිපයක් විස්තර කරන්න. (ලකුණු 15)

**(මුළු ලකුණු 25)**

## <u>ප්‍රශ්න අංක 05</u>

a. ධනය උත්පාදනය (wealth creation) සඳහා පාරිභෝගික තෘප්තිය (customer satisfaction) වැදගත් වන්නේ ඇයි, සහ ව්‍යාපාරයක මානව සම්පත සතු කාර්යභාරය කුමක්ද?

**(ලකුණු 10)**

b. මානව සම්පත් මගින් ඵලදායී උපාය මාර්ග ක්‍රියාත්මක කිරීමේ (effective strategy execution) වැදගත්කම පැහැදිලි කරන්න **(ලකුණු 15)**

**(මුළු ලකුණු 25)**

## <u>ප්‍රශ්න අංක 06</u>

a.අයවැයක් (Budget) ගොඩනඟන විට මානව සම්පත් උපායමාර්ග (HR initiatives) වලට ප්‍රමුඛත්වය දීම වැදගත් වන්නේ ඇයි?

**(ලකුණු 10)**

b. ඵලදායී අයවැය සන්නිවේදනයේ (budget communication) සහ අධීක්ෂණයේ (monitoring) වැදගත්කම විස්තර කරන්න.

**(ලකුණු 15)**

**(මුළු ලකුණු 25)**

## ප්‍රශ්න අංක 07

මානව සම්පත් ගිණුම්කරණය (HRA) යනු සංවිධානයක මානව ප්‍රාග්ධනයේ වටිනාකම මැනීම කෙරෙහි අවධානය යොමු කරන විශේෂිත ක්ෂේත්‍රයකි. මානව සම්පත් ගිණුම්කරණය (HRA) සාම්ප්‍රදායික ගිණුම්කරණයෙන් වෙන්කර මානව ප්‍රාග්ධනය අගය කිරීමට භාවිතා කරන ප්‍රවේශයන් පැහැදිලි කරන්න. එසේම, ආයතනයක HRA ක්‍රියාත්මක කිරීමේ ප්‍රධාන අභියෝග පැහැදිලි කරන්න.

**(මුළු ලකුණු 25)**

**(ලකුණු 25* ප්‍රශ්න 04 = මුළු ලකුණු 100)**

-සියළුම හිමිකම් ඇවිරිණි -

## Appendix

Mean = $\bar{x} = \frac{\Sigma f x}{\Sigma f}$

Median $L + \frac{n/2 - F}{f} * c$ =

Mode = $L + \frac{d_1}{d_1 + d_2} * c$